# ශ්‍රී ලංකා ගුරු සේවයේ වාර්ෂික ස්ථාන මාරු 2026 - අයදුම්පත් කැඳවීම

## ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

2026 වර්ෂයට අදාලව ශ්‍රී ලංකා ගුරු සේවයේ කලාප / අන්තර් කලාප/ අන්තර් පළාත් හා පළාත් සභා පාසලකින් ජාතික පාසල් සඳහා වාර්ෂික මාරු -2026 සඳහා අයදුම්පත් කැඳවීම 2025.05.26 දින සිට 2025.06. 09 දින දක්වා සිදු කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

අයදුම්පත් ඉදිරිපත් කිරීමේදි පහත සඳහන් ලිපි ලේඛන පමණක් ඉදිරිපත් කළ යුතු වන අතර, පහත උපදෙස් අනුගමනය කරමින් කලාප කාර්යාල මගින් ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අයදුම්පත්‍ර එවීමට කටයුතු කරන ලෙස දැනුම් දෙමි. **(ඉල්ලීම් ලිපි, අභියාචනා, වෛද්‍ය වාර්තා ආදී කිසිවක් අයදුම්පත සමඟ අමුණා නොඑවිය යුතුයි)**

<u>අන්තර් කලාප ස්ථාන මාරු සඳහා</u>

I. විදුහල්පති විසින් නිර්දේශ කරන ලද විධිමත් අයදුම්පත

ii. මුල් පත්වීම් ලිපියෙහි සහතික කළ පිටපත

iii. විනය විමර්ශන හෝ විගණන විමසුම් නොමැති බවට ලිපිය

iv. පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කිරීමේ ලිපිය

v. අන්තර් කලාප ස්ථාන මාරු අයදුම් කිරීමේදි අයදුම්පත්‍ර 02 ක් ඉදිරිපත් කළ යුතු වේ.

<u>අන්තර් පළාත් ස්ථාන මාරු සඳහා</u>

I. විදුහල්පති විසින් නිර්දේශ කරන ලද විධිමත් අයදුම්පත (බස්නාහිර පළාතට යොමුකරන අයදුම්පත් සඳහා අදාළ උපදෙස් බලන්න ඇමුණුම 3)

ii. මුල් පත්වීම් ලිපිය (සහතික කල පිටපත් 05)

iii. ස්ථාන මාරු වන පළාත තුළ ස්ථිර පදිංචිය තහවුරු කරන ග්‍රාම නිළධාරී සහතිකය (මුල් පිටපත හා සහතික කළ පිටපත් 04)

iv. ස්ථාන මාරු ලබා ගැනීමෙන් පසු පළාත තුළ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කරන බවට හා පළාතේ පුරප්පාඩු සහිත ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට කැමැත්ත ප්‍රකාශිත ලිපිය.

v. සේවය ස්ථිර කිරීමේ ලිපිය (සහතික කළ පිටපත් 04)

vi. පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලද නිලධරයන් අදාළ තනතුරේ නියමිත ශ්‍රේණියෙහි ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ අවසානයේ තැබීමේ කොන්දේසියට යටත්ව ස්ථාන මාරු වන පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහනය වීමට කැමැත්ත පළ කළ ලිපිය (මුල් පිටපත හා සහතික කළ පිටපත් 04)

vii. ස්ථාන මාරු අයදුම් කරන දිනට පූර්වාසන්න වසර 03 ක (පවත්නා වර්ෂයද ඇතුළත්ව) වැටුප් රහිත නිවාඩු ඇති/ නැති බවට වාර්තාව (මුල් පිටපත හා සහතික කළ පිටපත් 04)

viii. නිලධාරියාට එරෙහිව විනය කටයුතු ඇති/නැති බව සම්බන්ධයෙන් සහතිකය (මුල් පිටපත හා සහතික කළ පිටපත් 04)

ix. අදාල පළාත් සභාවේ සේවා කාලය තුළදී ඊට අදාලවන කිසියම් කරුණක් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියා මාර්ගයක් එම නිලධාරියාට එරෙහිව නොපවතින බවට වාර්තාව (මුල් පිටපත හා සහතික කළ පිටපත් 04)

x. නිලධාරියාට එරෙහිව බරපතල මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධව විගණන විමසුම් ඇති/නැති බවට සහතිකය(මුල් පිටපත හා සහතික කළ පිටපත් 04)

xi. අදාල නිළධාරියා පළාත් සභාවේ වියදමෙන් විශේෂ පුහුණුවක් ලබා තිබේ නම්, පුහුණුවට අදාල ගිවිසුම්ගත අනිවාර්යය සේවා කාලය ඉකුත්වී තිබීම හෝ කිසියම් බැඳුම්කරයකට යටත් කොට තිබී බැඳුම්කරයෙන් නිදහස් වී ඇති/ නැති බවට වාර්තාව (මුල් පිටපත හා සහතික කළ පිටපත් 03)

xii. ස්ථාන මාරු අයදුම්කරුගෙන් පළාත් සභාවට අයවිය යුතු ණය ශේෂයන් පිළිබඳ නිකුත් කරන වාර්තාව (මුල් පිටපත හා සහතික කළ පිටපත් 03)

<u>පොදු උපදෙස්</u>

- ❖ අන්තර් කලාප අයදුම්පත් නිකුත් කිරීමේදී **<u>මේ සමඟ අමුණා ඇති අයදුම්පත පමණක්</u>** ඉදිරිපත් කරන ලෙස විශේෂයෙන් අවධාරණය කරන අතර, අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුවේ.
- ❖ ස්ථාන මාරු අයදුම් පත්‍ර හා අනෙකුත් අවශ්‍ය ඇමුණුම් ඇතුලත්ව විදුහල්පතිගේ නිර්දේශ හා කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ නිර්දේශ සහිතව මෙම දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.
- ❖ අන්තර් පළාත් හා පළාත් සභා පාසලකින් ජාතික පාසල් අයදුම්පත්‍ර කට්ටල 05 කින් ඉදිරිපත් කළ යුතුවේ.
- ❖ නියමිත දිනට පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(වී.වී.එම්.ෆොන්සේකා)
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට

වී. වී. මනෝහරී ෆොන්සේකා
ශ්‍රී.ලං.අ.ප.සේ - I
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව